# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1940/7 - 2015 නොවැම්බර් මස 09 වැනි සඳුදා - 2015.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 41 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

දයාසිරි ජයසේකර,<br>ක්‍රීඩා අමාත්‍ය.

2015 නොවැම්බර් මස 09 වැනි දින,<br>කොළඹ දී ය.

නියෝග

2013 ජනවාරි මස 15 වැනි දින අංක 1793/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග වල ඇතුළත් 13 සහ 17 වන වගන්ති පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරමි.

(1) 13(1) නියෝගයේ ''කිසිම තැනැත්තකු'' යන වචනයෙන් පසුව ඇති ''ඉහත කිසිම තනතුරක්'' යන වචන වෙනුවට ''එම තනතුර'' යන වචන ආදේශ කිරීමෙන්.

(2) නියෝග අංක 13(2) හි ඇති අතුරු විධානයේ අවසානයට පහත සඳහන් නව අතුරු විධානය ඇතුලත් කිරීමෙන්

''තවදුරටත් කෙසේ වුවද, වසර හතරක සමස්ථ සේවා කාල එකතුව ගණනය කළයුත්තේ 2013 ජනවාරි මස පහළොස් (15) වැනි දින එනම් මෙම නියෝග ක්‍රියාත්මක වූ දින සිටය.''

(3) 17 වන නියෝගයේ ''රහස්‍ය ඡන්දය මගින්'' යන වචන වෙනුවට ''අත් එසවීම මගින්'' යන වචන ආදේශ කිරීමෙන්.